කාර්යාලය
அலுவலகம்
Office: 011-2186055

ලේකම්

ෆැක්ස්
பெகஸ
Fax: 011-2187249


# කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

## மகளிர்மற்றும்சிறுவர்அலுவல்கள்அமைச்சு

## MINISTRY OF WOMEN AND CHILD AFFAIRS


ඊමේල්/மின்னஞ்சல/Email: secycdwe@gmail.com
වෙබ් අඩවිය/இணையத்தளம்/ Website: WWW.childwomenmin.gov.lk


මගේ අංකය.
எனது இல. MWCA/2/5/3/12/2-3

ඔබේ අංකය

දිනය.
திகதி. 2018.07. 23

---

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,
සියළුම උපදේශන නිලධාරීන් වෙත.

**කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ සහන සොයුරි (දෙපාර්තමේන්තුගත) වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2018.**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයට අනුයුක්තව දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා උපදේශන මධ්‍යස්ථානවල සහන සොයුරි නිලධාරීන්ගෙන් 2018 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.සියළුම අයදුම්පත් මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව (ඇමුණුම1) සකස් කර ඔබගේ නිර්දේශ සමග 2018 අගොස්තු මස 31 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත එවීමට සැලැස්විය යුතු අතර, එදිනෙන් පසු ලැබෙන කිසිදු අයදුම්පතක් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ. ස්ථාන මාරුවීම් අපේක්ෂා කළත්, නොකළත් දැනට සිටින සේවා ස්ථානයේ නියමිත සේවා කාලය සම්පූර්ණ කරන සියළුම නිලධාරීන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

02.වාර්ෂික ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධාරීන් දැනට සිටින සේවා ස්ථානවල නියමිත සේවා කාලය සේවය කර තිබිය යුතුය. ඒ සඳහා කාලසීමාවන් පහත පරිදි වේ.

(අ) එක් සේවා ස්ථානයක අවම වශයෙන් අවුරුදු 05ක හෝ ඊට වැඩි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් හා එක් දිස්ත්‍රික්කයක් තුල අඛණ්ඩව හෝ ඛණ්ඩව උපරිම වසර 08ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්

(ආ) ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සපුරා තිබීම

(ඇ) මීන් පෙර කිසිදු ස්ථාන මාරුවීමක් ලබා නොමැති නිලධාරීන්

03.සියළුම ස්ථාන මාරුවීම් අයදුම් පත් 2018.08.31 දිනට පෙර ලැබීමට සලස්වන මෙන් දන්වන අතර අදාල නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී එහි සඳහන් කරුණු නිවැරදි ද යන්න පිළිබඳව හොඳින් පරීක්ෂා කර බලා අදාල තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවට තහවුරු කර ඔබගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කිරීම මැනවි.

2018/07/25

04.ඔබ දිස්ත්‍රික්කයේ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2018.12.31 දිනට අවම වශයෙන් අවුරුදු 05ක හෝ ඊට වැඩි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම්පත්‍ර ඉදිරිපත් කල හා නොකල සියලුම නිලධාරීන්ගේ විස්තර උපලේඛන 1 ආදර්ශය අනුව සහ අවුරුදු 05ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ නොකල නිලධාරීන්ගේ විස්තර උපලේඛන 2 ආදර්ශය අනුව සම්පූර්ණ කර 2018 අගෝස්තු 31 දිනට පෙර මා වෙත ඉදිරිපත් කල යුතුවේ.

05.අවශ්‍ය නිලධාරීන් ගණන ඉක්මවා කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් ලබා නොදෙන බවද, අතිරික්ත වන සේ නිලධාරීන් මාරු කිරීමෙන් අමාත්‍යාංශයේ කටයුතුවලට බාධාවක් පැමිණෙන බැවින් මින් ඉදිරියට එවැනි මාරුවීම් සිදු කරනු නොලබන බවද කාරුණිකව දන්වමි.

06.ස්ථාන මාරුවීම් ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට මෙම අමාත්‍යාංශය මගින් ඔබ ලේකම් කාර්යාලය / උපදේශන මධ්‍යස්ථාන වෙත අනුයුක්ත කර ඇති දෙපාර්තමේන්තුගත (ඒකාබද්ධ සේවයට අයත් නොවන) සහන සොයුරි නිලධාරීන් දැනුවත් කරන්නේනම් මැනවි. මෙම තොරතුරු අමාත්‍යාංශ වෙබ් අඩවිය වන www.childwomenmin.gov.lk හි ඇතුලත් කර ඇත.

ඩී.එස්.විජේසේකර

අතිරේක ලේකම් (පාලන)

ලේකම් වෙනුවට .